"ජනසෙත සුරකිමු"

# අයවැය ලේඛනය 2022

# வரவுசெலவு திட்டம் 2022

# BUDGET REPORT 2022

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

# වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

## 2022 වර්ෂයේ වැඩ සටහන් අයවැය ලේඛනය


| අංකය | පටුන | පිටු අංකය |
|---|---|---|
| 1 | සම්මුතිය | 1 |
| 2 | අය වැය-පණිවිඩය | 2-6 |
| 3 | අතීතයෙන් බිදක් | 7 |
| 4 | එදා මෙදා තුර ජනතා මෙහෙවරට කැප වූ ගරු සභාපතිතුමන්ලාගේ නාම ලේඛනය | 8 |
| 5 | සභාවේ ධුර ධාරීන්ගේ නාම ලේඛනය | 9 |
| 6 | පොදු සංඛ්‍යා ලේඛන තොරතුරු | 10 |
| 7 | ග්‍රාම නිළධාරී වසම් | 11 |
| 8 | සභා බල ප්‍රදේශයේ  කොට්ඨාශ | 12 |
| 9 | මිනිස් බල සාරාංශය | 13 |
| 10 | කාර්ය මණ්ඩල තොරතුරු | 14 -16 |
| 11 | අදායම් වියදම් තත්ත්වය | 17 |
| 12 | ප්‍රාග්ධන වියදම්  සාරාංශය | 18 |
| 13 | ආදායම් සාරාංශය | 19 |
| 14 | පුනරාවර්තන වියදම් සාරාංශය | 20 |
| 15 | පුනරාවර්තන ආදායම් /වියදම් විස්තර වැඩ සටහන් අංක 01 | 21-28 |
| 16 | පුනරාවර්තන ආදායම් /වියදම් විස්තර වැඩ සටහන් අංක 02 | 29 -35 |
| 17 | පුනරාවර්තන ආදායම් /වියදම් විස්තර වැඩ සටහන් අංක 03 | 36 -40 |
| 18 | පුනරාවර්තන ආදායම් /වියදම් විස්තර වැඩ සටහන් අංක 04 | 41 -45 |
| 19 | පුනරාවර්තන ආදායම් /වියදම් විස්කර වැඩ සටහන් අංක 05 | 46 -48 |
| 20 | පුනරාවර්තන ආදායම් /වියදම් වැඩ සටහන් අංක 06 | 49 -52 |
| 21 | ප්‍රාග්ධන වියදම්  සාරාංශය | 53-54 |
| 22 | සේවා නියුක්ති සාරාංශය | 55-56 |

# 2022 වර්ෂයේ වැඩ සටහන් අයවැය ලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින්, පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලද 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 06 වන කොටසේ 168 වන වගන්තිය ප්‍රකාර එහි නියමයන්ට හා නියෝගයන්ට අනුකූලව පිළියෙල කරන ලද ,2022 වර්ෂයේ වැඩ සටහන් අයවැය ලේඛනය 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 14 දින වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 5.1 (V) දරණ යෝජනාව මගින් සභා සම්මතකරන ලදි.

කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

# දැක්ම

## ජනසෙත සුරකිමු

# මෙහෙවර

වැලිගෙපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ
වෙසෙන ජනතාවගේ
ජීවිතවල පවත්නා අහිතකර කාර්යයන්
අවම කර සභා සීමාව තුළ ඇති සම්පත්
ප්‍රයෝජනයට ගනිමින්
එම ජීවිත ප්‍රවර්ධනය කිරීම.

~ වැලිගෙපොල ප්‍රාදේශීය සභාව ~

# ගරු සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 17 අතරින් එකක් වූ වැලිගෙපොල ප්‍රාදේශීය සභාවට තෙවන වරටත් සභාපතිවරයා වශයෙන් තේරී පත්වූ මවිසින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168 (1) වගන්තිය ප්‍රකාරව, 2022 වර්ෂය සඳහා පිළියෙල කරන ලද මෙම අයවැය ලේඛනය වත්මන් පාලන කාලය තුල මවිසින් ඉදිරිපත් කරනු ලබන සිව්වන අයවැය ලේඛනයයි.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා, ප්‍රමුඛ රජය විසින් ගෙනයනු ලබන "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ගමත් නගරයත් අතර සංවර්ධනයේ පවතින විෂමතාවය අවම මට්ටමට ගෙන එමින් සංවර්ධනයේ අරුණළු ගමට ගෙනයාමේ භාරධූර වගකීම පළාත් පාලන ආයතන වෙත පැවරී තිබේ. ඒ අනුව මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 50 ක් තුළ වෙසෙන 68111 ක් පමණ වූ ජනතාවගේ සෞඛ්‍යයට, පොදු උපයෝගීතා සේවාවන්ට සහ පොදු මංමාවත් ඇතුළු සියළු පහසුකම් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට සෑම උත්සාහයක්ම මවිසින් ගෙන ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකාව පමණක් නොව මුළු ලෝකයටම ගෝලීය අර්බුදයක්ව පවතින කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ වුවද, සංවර්ධන ක්‍රියාවලියට දායක වීමට හා එහි ප්‍රතිලාභ ජනතාව වෙත ලබාදීමට කටයුතු කලෙමි. ඉදිරි වර්ෂයේදිද මෙවැනි තත්ත්වයක් යටතේ වුවද පළාත් පාලන ක්ෂේත්‍රයේ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා ඉදිරි අයවැය උපයෝගී කරගැනීමට සෑම උත්සාහයක්ම දරමි. ප්‍රදේශයේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා සභා අරමුදල් ප්‍රමාණවත් නොවූවද, වෙනත් ආයතන හා දෙපාර්තමේන්තු වල මූල්‍යමය අනුග්‍රහයන් ලබමින් සභා බල ප්‍රදේශයේ අතිදුෂ්කර මාර්ග රැසක් ප්‍රධාන මාර්ග වලට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි සංවර්ධනය කර හමාරය. ඒ සඳහා දේශපාලන භේදයෙන් තොරව ඔබ සියළු දෙනාගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගනිමින් මාර්ග කි.මි. ලක්ෂයක් (100,000) සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහනට සමගාමීව මාගේ පූර්ණ මැදිහත්වීම මත මෙම සභා බල ප්‍රදේශය තුළ මාර්ග කි.මි. 150 ට ආසන්න ප්‍රමාණයක් කාපට් ව්‍යාපෘතියට ඇතුලත් කරමින් මෙ වන විට ඒවායේ වැඩ කටයුතු බොහොමයක් අවසන් කර ඇත. **ඉංග්‍රීසි ජාතිකයින් මේ රට පාලනය කරන සමයේදී වැලිගෙපොල හපුගස්තැන්න සිට උඩගම දක්වා මාර්ගය** ගමනාගමනය සඳහා සකස් කර තිබුණද අනාදිමත් කාලයක සිටම එහි කිසිදු සංවර්ධන කටයුත්තක් සිදුනොවී වල්බිහිවී තිබුණි. නමුත් මාගේ ධූරකාලය තුළ ප්‍රදේශවාසීන්ගේ පහසුව පිණිස එම මාර්ගය සංවර්ධනය කිරීමට හැකිවීම භාග්‍යයකි.

එමෙන්ම අම්බැවිල ගල්පාය, කරවිලයාය හරහා උඩවලව දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට හැකිවීම තුළින් ඉදිරියේදී සංචාරක කර්මාන්තය මෙම සභා බල ප්‍රදේශය තුළ වැඩිදියුණු කිරීමට අවස්ථාව උදාවනු ඇතැයි විශ්වාස කරමි. ඊට අමතරව වර්තමාන සංවර්ධන අවශ්‍යතා වලට ගැලපෙන අයුරින්,

අකරැල්ල, පරගහමඩිත්ත, ඉලුක්කුඹුර මාර්ගය,
දෙල්ගස්හංදිය ගල්කන්ද හරහා ගොඩකවෙල දක්වා මාර්ගයත්
වැලිගෙපොල කොට්ටිඹුල්වල මාර්ගයත්, කාපට් අතුරා සංවර්ධනය කිරීමට පියවර ගතිමි.

එමෙන්ම, වත්මන් රාජ්‍ය ප්‍රතිපත්ති අනුව ක්‍රියාත්මක වන, "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන යටතේ, "වැඩ සමඟ යළි ගමට" ව්‍යාපෘතියට සමගාමීව වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා රුපියල් අසූ ලක්ෂයක (8,000,000.00) සහ ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා රුපියල් ලක්ෂ හැට පහක (6,500,000.00) සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලැබී ඇති අතර ප්‍රධාන අමාත්‍යාංශය මඟින් රුපියල් ලක්ෂ දහයක (රු.1,000,000.00) මුදලක්ද සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාදී ඇත.

තවද, 2022 වර්ෂයේදී අංග සම්පූර්ණ කාර්යාල සංකීර්ණය ඉදිකර අවසන් කිරීම මාගේ ඒකායන අපේක්ෂාවයි. ඒ අනුව 2021 වර්ෂය වන විට කාර්යාල ගොඩනැගිල්ලේ ඉහළ මහළ රැස්වීම් ශාලා පහසුකම් සහිතව නිම කිරීමට හැකිව තිබේ. එමෙන්ම සීමිත ඉඩ පහසුකම් මධ්‍යයේ පවත්වා ගෙන ආ සභා රැස්වීම ඉඩ පහසුකම් සහිතව පවත්වා ගෙන යාමට හැකිවන පරිදි අංග සම්පූර්ණ සභා ගර්භය ඉදි කිරීම ආරම්භ කර ඇති අතර ඉදිරි වර්ෂයේ දී සභා රැස්විම එහි පවත්වා ගෙන යාමට හැකිවන බව ප්‍රකාශ කරමි.සභා අරමුදල් මෙන්ම දේශීය ණය සහ සංවර්ධන අරමුදල් යොදවා ආරම්භ කරන ලද මෙම ඩිජිටල් පුස්තකාල පහසුකම් සහිත කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමටද අප ගත් වැයම අගය කරමින් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය 2021 වර්ෂයේදී එහි සිව්වන අදියර සඳහා රුපියල් එක්කෝටි හය ලක්ෂ අසූ එක් දහසක් (10,681,000.00) ලබා දීම පැසසුමට ලක් කල යුතුය. කාර්යාල ගොඩනැගිල්ලේ සියළුම ඉදිකිරීම් සඳහා මේවන විට රුපියල් ලක්ෂ හයසිය අසූවක පමණ මුදලක් වැය කර ඇත. කොවිඩ් 19 වසංගතය මේ රට වෙලාගෙන ඇති මෙවන් අවදියක වුවද අපගේ කාර්යභාරයන් නොපිරිහෙලා ඉටුකිරීමට මා නොපැකිළිව කටයුතු කලෙමි. බල ප්‍රදේශය තුළ වසංගත තත්ත්වය පාලනය කිරීමට ඕපනායක හා වැලිගෙපොල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරින්තුමන්ලාද වැලිගෙපොල හා ඕපනායක ප්‍රාදේශීය ලේකම්තුමන්ලාද,ඕපනායක, වැලිගෙපොල හා ගොඩකවෙල පොලිස් ස්ථානාධිපතිතුමන්ලාද, සමඟ එක්ව සහයෝගයෙන් කටයුතු කළෙමි. විශේෂයෙන් බල ප්‍රදේශයේ ජනතාව පූර්ණ එන්නත්කරණයට භාජනය

කිරීම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ප්‍රචාරක ව්‍යාපෘතිවලින් ඇතුළු අනෙකුත් පහසුකම් ලබාදීම සඳහා ක්‍රියා කළෙමි. එමෙන්ම මල ප්‍රදේශය ඇතුළත පිහිටි හෝටල්, සාප්පු, බේකරි ඇතුළු පොදු ස්ථාන විශේෂ පරීක්ෂණයට ලක්කිරීමට පියවර ගන්නා ලදී. ඩෙංගු රෝග ව්‍යාප්තිය වැලැක්වීම පිණිසද මහනගර සහ වැලිගමපොල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සමඟ අත්වැල් බැඳ ගනිමින් කටයුතු කළ අතර,

සකල තිසි කළමනාකරණයට ලක් කිරීම තුළින් මල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය හා ආරක්ෂාව ඇති කිරීම පිණිස සහා කම්කරුවන් සහ ඊට අදාළ ට්‍රැක්ටර් රථ යොදවා ඇත. ඉදිරි වර්ෂයේදීද එම සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කරමි. ආහාර නියැදි පරීක්ෂාව සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සහාය ලබා ගත් අතර, ඒවා රජයේ රස පරීක්ෂක වෙත යොමු කිරීම සඳහා අවශ්‍ය ප්‍රවාහන වියදම් සහා අරමුදලින් ලබා දීමටද කටයුතු කළෙමි. ආයුර්වේද වෛද්‍ය සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස 2021 වර්ෂයේදී පළාත් ප්‍රතිපාදන සහ සහා අරමුදලින් රුපියල් හාර ලක්ෂ අනූහතර දහසක ඖෂධ මිලදීගෙන ඇති අතර එම වර්ෂයේදී රෝගීන් 2230 දෙනෙකුට ප්‍රතිකාර ලබාදී ඇත. ඉදිරි වර්ෂයේදීද එම සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාමට පියවර ගනිමි.

ප්‍රාදේශීය සහා පනතේ විධිවිධාන ප්‍රකාරව මළ අපද්‍රව්‍ය විධිමත්ව බැහැරලීම පළාත් පාලන ආයතන වල කාර්ය භාරයක් වුවද, ඒ සඳහා තිසි ක්‍රමවේදයක් මෙම සභාව සතුව නොපැවතිනි. නමුත් ඒ සඳහා පූර්වාරක්ෂක වැඩ පිළිවෙලක් දියත් කිරීමට මවිසින් පියවරගත් අතර, යෝජිත මිලාප්‍රමාණ පද්ධතියේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතින බැවින්, 2022 වර්ෂය මුල් කාර්තුවේදී එම සේවාවන් ජනතාවට ලබා දීමට හැකිවනු ඇතැයි විශ්වාස කරමි. 2022 වර්ෂයේදී මළ අපද්‍රව්‍ය බැහැරලීම තුළින් රුපියල් ලක්ෂ දහයක ඇස්තමේන්තු ආදායමක් අපේක්ෂා කරමි.

ජාතික "පොහොර භාවිතයේ නව පෙරලියට" කාබනික පොහොර භාවිතය ජනතාව අතර ප්‍රචලිත කිරීම පිණිස රජය විසින් ගෙනයන ජාතික වැඩසටහන දායකත්වය ලබාදෙමින්, සකල කළමනාකරණය තුළින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සබරගමුව පළාත් සභාව මගින් රුපියල් පනස් ලක්ෂයක(5,000,000.00) මුදලක් ලබාදී ඇති බැවින්, එම ඉදිකිරීම් අවසන් වූ වහාම පොහොර නිෂ්පාදනය සඳහා පියවර ගන්නා බව සිහිපත් කරන අතර, ඉදිරියේදී සකල කළමනාකරණ භූමිය විධිමත් පාලනයකින් යුතුව පවත්වාගෙන යාමට වෙනම නිලධාරීන් සහ සේවකයින් යෙදවීමට අපේක්ෂා කරමි.

සභාවේ ප්‍රධානතම ආදායම් මාර්ගයක් වන ජල සේවාවන්වල පවත්නා අඩු පාඩු සම්පූර්ණ කර එමගින් ලැබෙන ආදායම් වැඩි කර ගැනීමටද කටයුතු කරමි. ඒ අනුව කන්දේවිහාර ජල මූලාශ්‍රයට අලුතින් ගබඩා ටැංකියක් ඉදිකිරීමටද පැලැන්දකන්ද ජල ව්‍යාපෘතියේ අඩු පාඩු සම්පූර්ණ කිරීමටද, අක්‍රියව ඇති ජල මාපක වෙනුවට අලුතින් ජල මනු මිළදී ගැනීමටද, මාගේ ඉල්ලීම පරිදි පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යංශය මගින් ප්‍රතිපාදන ලබා ගැනීමටද කටයුතු කළෙමි.

දීර්ඝ කාලයක සිටම ප්‍රදේශයේ ජනතාව මාතුල තැබූ විශ්වාසය මත එම ජනතාවගේ ගෞරවය, හා ප්‍රසාදය දිනාගත් ආයතනයක් ලෙසට මෙම ආයතනය පත් කිරීමට මම සැම උත්සාහයක්ම ගන්නා බව සිහිපත් කරමි. ඒ අනුව ඔපනායක හා වැලිගෙපොල නගරය කේන්ද්‍රකොටගෙන එම නගරවල නව්‍යතාවයන් ඇති කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එක්ව සැලසුම් සකස් කරමින් පවතී. ඔපනායක නගරය තුළ හෙළබොජුන්හලක් ස්ථාපනය කිරීමට මා ගත් උත්සාහයද මල්ඵල ගැන්වී ඇත. එමගින් නව ආදායම් ප්‍රභවයක් මෙවර අයවැයට එක් කිරීමට හැකිවීම භාග්‍යයක් කොට සලකමි. එමගින් දේශීය ආහාර ප්‍රවර්ධනය ,සෘජු සහ වක්‍ර රැකියා අවස්ථා ඇති කිරීම, මෙන්ම සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම තුළින් බල ප්‍රදේශයේ ජනතාවට මෙන්ම බල ප්‍රදේශයට පිටතින් ඇදී එන ජනතාවට ගුණාත්මක සේවාවක් මෙම සභාව මගින් ලබා දීමට හැකිවනු ඇත.

තවද බල ප්‍රදේශය පුරා විහිදී ඇති සියළුම සුසාන භූමි, ක්‍රීඩා පිටි ඇතුළු සභාව විසින් භුක්ති විඳින ඉඩම් සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි වීථි පහන් සවි කර ඇති අතර අවශ්‍ය ස්ථාන හඳුනාගෙන අඩුපාඩු සම්පූර්ණ කිරීමට පියවර ගනිමි.

තම ක්‍රීඩා කුසලතා වර්ධනය කර ගැනීමට සංවර්ධිත ක්‍රීඩාංගන දෙකක් බල ප්‍රදේශයේ ඔපනායක සහ වැලිගෙපොල කොට්ඨාස දෙකම ආවරණය වන පරිදි ලබා ගැනීමට හැකිවීම අප ලද ජයග්‍රහනයකි.මේ සඳහා රුපියල් ලක්ෂ හැටපහක (රු.6,500,000.00) පමණ මුදලක් ප්‍රධාන අමාත්‍යාංශය හා පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලබාදී ඇත.මේ වනවිට වැලිගෙපොල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ තලගස්කන්ද ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ වැඩ කටයුතු අවසන් කර ඇත. ඔපනායක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ඉඹුල්තැන්න ක්‍රීඩා පිටිය සංවර්ධනයට අවශ්‍ය මැනුම් කටයුතු, ඉඩම් පවරා ගැනිම් කටයුතු මෙවන විට සිදු කරමින් පවතින අතර අයවැය වර්ෂය තුළ මෙම ක්‍රීඩාංගනයෙහි වැඩ කටයුතු නිමකිරීමට හැකිවනු ඇත.තවද තැන්නහේන පහළගම්මැද්ද ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා රුපියල් ලක්ෂ පහළොවක(1,500,000.00) මුදලක් ලබාදී ඇත.අනෙකුත් සුභ සාධන වැඩ සටහන් අතරට පූර්ව ළමාවිය සංවර්ධන ම්‍යස්ථානයක් ඉදිකිරීමට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ප්‍රතිපාදන ලබා ගැනීමට හැකිවීම ද සතුටට කරුණකි.

තොරතුරු තාක්ෂණය ලෝකයේ ප්‍රචලිතව පවතින මෙවන් අවධියක මෙම ආයතනය හරහා ඊ පුස්තකාල සේවාවක් පවත්වා ගෙන යාමට අවස්ථාව ලැබී තිබීමද අප ලද ජයග්‍රහණයකි.

මෙම සියළු කාර්යයන් මෙහෙය වීමේදී ,පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමට අවශ්‍ය නායකත්වය ලබා දෙන අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටද, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාටද, සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර ටිකිරි කොබ්බෑකඩුව මැතිතුමාටද, ගරු අමාත්‍යතුමන්ලා ඇතුළු රත්නපුර දිස්ත්‍රික්කයේ සියළුම ගරු අමාත්‍යතුමන්ලා හා අමාත්‍යතුමියන්ලාද, ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාද ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මෙම සියළු කාර්යයන් සාර්ථක කර ගැනීමට මහත් ශක්තියක් සපයමින් කටයුතු කරන මෙම සභාවේ ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාටද මන්ත්‍රීතුමියන්ලාටද, ස්තුතිය පිරිනමා සිටිමි.තවද මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම ලබාදෙන සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියළුම අමාත්‍යාංශ ලේකම්තුමන්ලා හා ලේකම්තුමියන්ලාටද, පළාත් පාලන කොමසාරිස්තුමා, සහකාර පළාත් පාලන කොමසාරිස්තුමා ඇතුළු දෙපාර්තමේන්තු නිලධාරීන්ටද මාගේ ප්‍රණාමය පුදකරමි.

පරිපාලන කටයුතු වලදී සුහදව කටයුතු කරන වැලිගෙපොල හා ඕපනායක ප්‍රාදේශීය ලේකම්තුමන්ලාටද, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමන්ලාටද, ඕපනායක, වැලිගෙපොල හා ගොඩකවෙල පොලිස් ස්ථානාධිපතිතුමා ඇතුළු රාජ්‍ය නිළධාරීන්ටද මාගේ ස්තුතිය පිරිනමන අතර, ඉදිරියටද ඔවුන්ගේ සහාය එලෙසම ලැබෙනු ඇතැයි විශ්වාස කරමි.

මූල්‍යමය කාර්යන්හිදී එක්ව කටයුතු කරන පැල්මඩුල්ල, ඕපනායක මහජන බැංකු කළමනාකාර තුමන්ලාටද එම කාර්ය මණ්ඩලයටද මාගේ ස්තුතිය පිරිනමමි.කාර්යාල කටයුතු වලදී මා හා එක්ව කටයුතු කරන ලේකම්තුමිය ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටද මාගේ ස්තුතිය පුදකර සිටින අතර,

කලට වේලාවට බදු, බලපත්‍ර ගාස්තු ගෙවමින් සහයෝගය දෙන ඔබ සැමටද, පොදු කටයුතු වලදී අප හා එක්ව කටයුතු කරන ප්‍රදේශවාසී ජනතාවටද ස්තුතිය පිරිනමමින්,

**2022 වර්ෂය ඔබ සැමට සුබ නව වසරක් වේවායි !ප්‍රාර්ථනා කරමි.**

# GN DIVISION & ROAD NETWORK
# WELIGEPOLA PRADESHIYA SABHA




| GND CODE | GND NAME |
|---|---|
| Weligepola | |
| 219 | Mulatiupola |
| 219A | Helangola |
| 219B | Galpaya |
| 219C | Madowalalanda |
| 219D | Bambarangala |
| 219E | Kotimbulwala |
| 219F | Posathota |
| 220 | Badullegama |
| 219A | Elamalpe |
| 220B | Kalatuwakanda |
| 220C | Thennahena |
| 220D | Thalagaskanda |
| 221 | Ranwela |
| 222A | Menaganeya |
| 221B | Aninaduwa |
| 221C | Uraranwala |
| 239 | Weligepola |
| 239A | Kongaslanna |
| 239B | Gangodagama |
| 239C | Bodhigoda |
| 240 | Panana |
| 240A | Bulumbura |
| 240B | Galpodagama |
| 240C | Panagahamandiya |
| 247 | Balmolliyanda |
| 247A | Udagangoda |
| 248 | Urawela |
| 248A | Poluganawela |
| 249 | Handagiriya |
| 249A | Handagirigoda |
| Opanayake | |
| 241 | Akuralla |
| 241A | Uyanagoda |
| 242 | Hatadda |
| 242A | Batadura |
| 242B | Hatalla Egoda |
| 242C | Gallanda |
| 243 | Huruwala South |
| 243A | Dambeliya |
| 244 | Huruwala North |
| 244A | Hallinna |
| 244B | Malmerikanda |
| 244C | Methawala |
| 244D | Pothupitahena |
| 245 | Opanayaka |
| 245A | Meegahawela |
| 245B | Kandawatiya |
| 246 | Madola |
| 246A | Urawela |
| 246B | Pathwelakanda |
| 246C | Wellahatiya |

| POINT | NAME |
|---|---|
| AGA | Divisional Secretariat |
| ASC | Agrarian Services Centre |
| BT | Buddhist Temple |
| CC | Community Centre |
| CO-Op | Co-Operative Shop |
| D | Dispensary |
| DH | District Hospital |
| FC | Factory |
| GH | Government Hospital |
| GSC | Govijana Seva Centre |
| HC | Health Centre |
| HS | Historical Sites |
| HT | Hindu Temple |
| M | Mosque |
| PO | Post Office |
| POS | Police Station |
| RB | Rural Bank |
| S | School |
| SPO | Sub Post Office |

# අතීතයෙන් බිඳක්...........

සබරගමුව පළාතේ,
රත්නපුර දිස්ත්‍රික්කයේ
මැද කෝරළයේ,

"හෙලපල්ල පළාත ගම් සභාව"

**නමින් ආරම්භ වූ මෙම පළාත් පාලන ආයතනය,**
1981.07.01**දින සිට,**
**රත්නපුර දිස්ත්‍රික් සංවර්ධන සභාවේ,**

"හෙලපල්ල පළාත සංවර්ධන සභාඋප කාර්යාලය"
**නමින් හඳුන්වනු ලැබූ අතර,**

1988.01.01**දින සිට**

## "වැලිගෙපොල ප්‍රාදේශීය සභාව"

**නමින් සංස්ථාපනය වූ වගයි ......**

# එදා මෙදා තුර ජනතා මෙහෙවරට කැප වූ
# ගරු සභාපතිතුමන්ලා

| | | | |
|---|---|---|---|
| ඩී.එම්.ලොකුබණ්ඩා මැතිතුමා | 1943-07-01 | - | 1943-12-31 |
| ඩී.ඩී.වෙල්ලාල මැතිතුමා | 1944-01-01 | - | 1957-05-30 |
| ඩී.පී. වෙල්ලාල මැතිතුමා | 1957-07-12 | - | 1961-01-31 |
| ඩබ්.එම්.නාගරත්න බණ්ඩාර මැතිතුමා | 1961-02-20 | - | 1977-07-31 |
| **රත්නපුර දිස්ත්‍රික් සංවර්ධන සභාව** | 1981-07-01 | - | 1987-12-31 |
| ඊබට් ලියන පතිරණ මැතිතුමා | 1988-01-01 | - | 1988-06-30 |
| ප්‍රේමදාස වල්ලකැටිය මැතිතුමා | 1998-07-01 | - | 1991-06-30 |
| එච්.ඒ.විජේරත්න මැතිතුමා | 1991-07-01 | - | 1997-02-28 |
| ඩබ්.එම්. උදේනි වීරසේකර මැතිතුමා | 1997-04-15 | - | 2002-04-14 |
| එච්.ඒ.විජේරත්න මැතිතුමා | 2002-04-15 | - | 2006-04-14 |
| කැඑම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා | 2006-04-15 | - | 2011-01-05 |
| **බලයලත් නිලධාරී** | 2011-01-06 | - | 2011-07-26 |
| කැඑම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා | 2011-07-30 | - | 2015-07-31 |
| **බලයලත් නිලධාරී** | 2015-08-01 | - | 2018-04-04 |
| කැඑම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා | 2018-04-05 | - | මේ දක්වා |

# සභාවේ ධූර ධාරීන්ගේ ලේඛණය

| අනු අංකය | නම | තනතුර | ලිපිනය |
|---|---|---|---|
| 1 | කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මයා | සභාපති | හෙලපල්ල, මාදොල, ඕපනායක |
| 2 | ඩබ්ලිව්.ඒ. සමන් ජීවලාල් වීරසිංහ මයා | උප සභාපති | ගල්පාය, පල්ලෙබැද්ද |
| 3 | ජී.ජී. සිසිර ප්‍රේමකුමාර මයා | සභික | අකරැල්ල, ඕපනායක |
| 4 | ආර්.ඒ. රෝහණ විජේරත්න මයා | සභික | මොරවිටිවල,ඕපනායක |
| 5 | ඩී. බුද්ධික වීරසිංහ මයා | සභික | රංවල, ගොඩකෙවෙල |
| 6 | ඩී.එච්. සිරිපාල මයා | සභික | වතුකන්ද, ඕපනායක |
| 7 | ඒ.එම්.අයි. සමන්ජීව මයා | සභික | රංවලයාය, රංවල, ගොඩකවෙල |
| 8 | එල්.ඒ. ගුණතිලක මයා | සභික | පනානපාර, කොන්ගස්තැන්න |
| 9 | එම්.ආර්. රත්නපාල මයා | සභික | හඳගිරිය, බලංගොඩ |
| 10 | ඒ.එම්.අයි.පී. රණතුංග මයා | සභික | වැලිගෙපොල,බලංගොඩ |
| 11 | අචිනි එස්. අබෙවික්‍රම මිය | සභික | මල්මීකන්ද, ඕපනායක |
| 12 | එච්.ඒ. දමිත් නිරෝෂන් මයා | සභික | රංවල, ගොඩකවෙල |
| 13 | එන්.වී. ශ්‍රීමාවති මිය | සභික | කෝන්ගස්තැන්න,බලංගොඩ |
| 14 | පී.ජී. ශාන්ත දෙල්ගහකොටුව මයා | සභික | මුත්තෙටුටපොල, පල්ලෙබැද්ද |
| 15 | ජී.එල්.ලාල් කුමාරරත්න මයා | සභික | හඳගිරිය, වැලිගෙපොල |
| 16 | ඩී.කේ. ප්‍රසාද් අසිත මයා | සභික | අම්බැවිල, පල්ලෙබැද්ද |
| 17 | ඒ.ඩබ්ලිව්. සුමනාවතී මිය | සභික | තැන්නහේන, ඕපනායක |
| 18 | පී.ආර්.එස්.ධම්මිකා මිය | සභික | ඌරාවල, වැලිගෙපොල |
| 19 | ටී.සී.එස්. ඉසුරුමුණි මයා | සභික | උඩරංවල, රංවල, ගොඩකෙවෙල |
| 20 | එන්.ජී.යු. ඩබ්ලිව්. කුමාර මයා | සභික | බටෛවෙල,හත්තැල්ල, ඕපනායක |

# පොදු සංඛ්‍යා ලේඛන තොරතුරු

| | |
|---|---|
| පළාත | සබරගමුව පළාත |
| පරිපාල දිස්ත්‍රික්කය | රත්නපුර |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඕපනායක,වැලිගෙපොල |
| මැතිවරණ කොට්ඨාශය | "ඉ" රක්වාන |
| බල ප්‍රදේශයේ විශාලත්වය | ව.කි.මී.420 |
| ජනගහනය | 68,111 |
| කොට්ඨාශ සංඛ්‍යාව (කේවල කොට්ඨාශ 09, බහු කොට්ඨාශ 01 | 10 |
| ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව | 48,928 |
| සේවක සංඛ්‍යාව (අනුමත) | 76 |
| සභාව සතු වාහන සංඛ්‍යාව (කැබ් රථ 04,ට්‍රැක්ටර් 06,අත් ට්‍රැක්ටර් 01,යතුරු පැදි 01,පාපැදි 01,ජල බවුසර් 02 ගලි බවුසර් 01 | 16 |
| දුරකථන අංකය කාර්යාලය | 045-2270410/045-2270675 |
| ෆැක්ස් අංකය(කාර්යාලය) | 045-2270410 |
| විද්‍යුත් තැපැල | weligepolaps@gmail.com |
| ආයුර්වේද බෙහෙත් ශාලාව(ඕපනායක) | 1 |
| උප කාර්යාලය(වැලිගෙපොල) | 1 |
| පුස්තකාලය(ඕපනායක/වැලිගෙපොල/ගල්පාය/අකරැල්ල)) | 4 |
| පෙර පාසල් (ඕපනායක/මුත්තෙට්ටුපොල/සඳගනාගම) | 3 |
| ජල ව්‍යාපෘති සංඛ්‍යාව | 4 |

| | |
|---|---|
| සභාව සතු සුසාන භූමි | 5 |
| ක්‍රීඩා පිටි | 9 |
| පූජා ශාලා | 11 |
| *ආදායම්* | |
| වරිපනම් බදු අය කරන දේපල සංඛ්‍යාව | 1267 |
| 1. නිවාස | 807 |
| 2. ව්‍යාපාරික ස්ථාන | 383 |
| 3. කර්මාන්ත ශාලා | 37 |
| 4. ආගමික ස්ථාන | 7 |
| 5. රජය | 33 |
| වරිපනම් බදු ප්‍රතිශතය | 6% |
| අක්කර බදු අය කරන දේපල සංඛ්‍යාව | 154 |
| ජල පාරිභෝගික සංඛ්‍යාව | 2200 |
| සති පොලවල් | 3 |
| පොල කඩ කාමර (ඕපනායක/ගල්පාය) | 13 |
| බිම් බදු ස්ථාන | 9 |
| නැණසල මධ්‍යස්ථාන | 1 |
| පොදු කරාම | 9 |
| විථි පහන් | 649 |
| පොදු වැසිකිළි | 3 |

# සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම්

| ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | | | |
|---|---|---|---|
| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම | අංකය | ජනගහනය |
| 1 | අකරැල්ල | 241 | 2278 |
| 2 | ලියනගොඩ | 241 A | 1381 |
| 3 | හත්තැල්ල | 242 | 1338 |
| 4 | බටදූර | 242 A | 1387 |
| 5 | හත්තැල්ල එගොඩ | 242 B | 1197 |
| 6 | ගල්කන්ද | 242 C | 759 |
| 7 | දකුණු හුණුවල | 243 | 1614 |
| 8 | දන්දෙණිය | 243 A | 1383 |
| 9 | උතුරු හුණුවල | 244 | 2435 |
| 10 | හල්ලින්න | 244 A | 2312 |
| 11 | මල්මීකන්ද | 244 B | 1275 |
| 12 | මැටිහක්වල | 244 C | 1256 |
| 13 | පොල්වත්තහේන | 244 D | 1290 |
| 14 | ඕපනායක | 245 | 3057 |
| 15 | මීගහවෙල | 245 A | 1907 |
| 16 | කැන්දකැටිය | 245 B | 750 |
| 17 | මාදොල | 246 | 1244 |
| 18 | උඩවෙල | 246 A | 1026 |
| 19 | පැලැන්දකන්ද | 246 B | 1556 |
| 20 | වල්ලකැටිය | 246 C | 1318 |

| වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | | | |
|---|---|---|---|
| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම | අංකය | ජනගහනය |
| 1 | මුත්තෙට්ටුපොල | 219 | 951 |
| 2 | හටන්ගල | 219 A | 1824 |
| 3 | ගල්පාය | 219 B | 3061 |
| 4 | මඩවලලන්ද | 219 C | 1093 |
| 5 | බිඹිරගල | 219 D | 1737 |
| 6 | කෝට්ටිඹුල්වල | 219 E | 935 |
| 7 | පුස්සෙතොට | 219 F | 1419 |
| 8 | බදුල්ලෙගම | 220 | 1415 |
| 9 | එලමල්පෙ | 220 A | 991 |
| 10 | කෙලටුවාකන්ද | 220 B | 842 |
| 11 | තැන්නහේන | 220 C | 1429 |
| 12 | තලගස්කන්ද | 220 D | 1364 |
| 13 | රංවල | 221 | 1213 |
| 14 | මැදගංඹය | 221 A | 594 |
| 15 | අඹමඩුව | 221 B | 1308 |
| 16 | උඩරංවල | 221 C | 2215 |
| 17 | වැලිගෙපොල | 239 | 1225 |
| 18 | කෝන්ගස්තැන්න | 239 A | 862 |
| 19 | ගංගොඩගම | 239 B | 1083 |
| 20 | බෝපිටිගොඩ | 239 C | 1138 |
| 21 | පනාන | 240 | 1003 |
| 22 | ඉළුක්කුඹුර | 240 A | 1039 |
| 23 | ගල්ගොඩගම | 240 B | 1202 |
| 24 | පරගහමඩිත්ත | 240 C | 1013 |
| 25 | බෙලිමාලියද්ද | 247 | 868 |
| 26 | උඩගංගොඩ | 247 A | 1226 |
| 27 | ඌරාවල | 248 | 1598 |
| 28 | පලුගහවෙල | 248 A | 1037 |
| 29 | හඳගිරිය | 249 | 590 |
| 30 | හඳගිරිගොඩ | 249 A | 1073 |

# සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ

| කොට්ඨාශ අංකය | කොට්ඨාශයේ නම | සංයුක්ත ග්‍රාම නිලධාරී වසම |
|---|---|---|
| 1 | හුණුවල | 243 - හුණුවල |
| | | 244 - උතුරු හුණුවල |
| | | 244 A - හල්ලින්න |
| | | 244 B –මල්මීකන්ද |
| | | 244 C - මැටිහක්වල |
| | | 244 D - පොල්වත්තහේන |
| 2 | උඩවෙල | 245 A - මීගහවෙල |
| | | 245 B - කැත්දකැටිය |
| | | 246 - මාදොල |
| | | 246 A - උඩවෙල |
| | | 246 B - පැළැන්දකන්ද |
| 3 | ඕපනායක | 242 - හත්තැල්ල |
| | | 242 B - හත්තැල්ල එගොඩ |
| | | 243 A - දන්දෙනිය |
| | | 245 - ඕපනායක |
| 4 | අකරැල්ල | 241 - අකරැල්ල |
| | | 241 A - ලියනගොඩ |
| | | 242 A - බටදූර |
| | | 242 C - ගල්කන්ද |
| | | 246 C - වල්ලකැටිය |
| 5 | පනාන | 239 A - කෝන්ගස්තැන්න |
| | | 239 C - බෝපිටිගොඩ |
| | | 240 - පනාන |
| | | 240 A - ඉළුක්කුඹුර |
| | | 240 B- ගල්ගොඩගම |
| | | 240 C - පරගහමඩිත්ත |
| 6 | රංවල | 220 A - එලමල්පේ |
| | | 220 C - තැන්නහේන |
| | | 221 - රංවල |
| | | 221 B - අම්මඩුව |
| | | 221 C - උඩරංවල |

| කොට්ඨාශ අංකය | කොට්ඨාශයේ නම | සංයුක්ත ග්‍රාම නිලධාරී වසම |
|---|---|---|
| 7 | බදුල්ලේගම | 220 - බදුල්ලේගම |
| | | 220 B - කලටුවාකන්ද |
| | | 220 D - තලගස්කන්ද |
| | | 221 A - මැදගංඔය |
| 8 | වැලිගෙපොල | 219 A - හටංගල |
| | | 219 E - කොට්ටිඹුල්වල |
| | | 239 - වැලිගෙපොල |
| | | 239 B - ගංගොඩගම |
| | | 348 - ඌරාවල |
| | | 248 A - පලුගහවෙල |
| 9 | හඳගිරිය | 247 - බෙලිමාලියද්ද |
| | | 247 A - උඩගංගොඩ |
| | | 249 - හඳගිරිය |
| | | 249 A - හඳගිරිගොඩ |
| 10 | ගල්පාය | 219 - මුත්තෙට්ටුපොල |
| | | 219 B - ගල්පාය |
| | | 219 C - මඩවලලන්ද |
| | | 219 D - බඹරගල |
| | | 219 F - පුස්සතොට |

# වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මිනිස්බල සාරාංශය

| අනු අංක | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | පවත්නා වර්ෂය 2021 | පුරප්පාඩු සංඛ්‍යාව 2021 | අතිරික්ත 2021 |
| 1 | ලේකම්/කළමනාකරණ සහකාර (අධි ශ්‍රේණිය) | 1 | - | 1 | - |
| 2 | කළමනාකරණ සහකාර | 6 | 5 | 1 | - |
| 3 | සංවර්ධන නිලධාරි | 25 | 21 | 4 | _ |
| 4 | ආදායම් පරික්ෂක | 1 | - | 1 | - |
| 5 | කාර්යාල කාර්ය සහයක | 3 | 3 | - | - |
| 6 | රියදුරු | 4 | 4 | - | - |
| 7 | ආයුර්වේද වෛද්‍ය නිළධාරි | 1 | 1 | - | - |
| 8 | ඖෂධ සංයෝජක | 1 | 1 | - | - |
| 9 | සෞඛ්‍ය කම්කරු | 7 | 5 | 2 | - |
| 10 | තාක්ෂණ නිලධාරි(ii ශ්‍රේණිය) | 2 | 2 | _ | |
| 11 | වැඩ කේෂ්ත්‍ර කම්කරු | 16 | 10 | 6 | - |
| 12 | මුරකරු | 1 | - | 1 | - |
| 13 | පුස්තකාලයාධිපති | 1 | 1 | - | - |
| 14 | පුස්තකාල සහයක | 4 | 4 | - | - |
| 15 | පෙර පාසල් පාලිකා | 1 | - | 1 | - |
| 16 | විදුලි කාර්මික | 1 | 1 | | - |
| 17 | තාක්ෂණික සහකාර | 1 | | 1 | |
| | එකතුව | 76 | 58 | 18 | 0 |

| අනුමත පුරප්පාඩු | |
|---|---|
| ලේකම්/කළමනාකරණ සහකාර (අධි ශ්‍රේණිය) | 1 |
| කළමනාකරණ සහකාර | 1 |
| පෙර පාසල් පාලිකා | 1 |
| ආදායම් පරික්ෂක | 1 |
| මුරකරු | 1 |
| වැඩ කේෂ්ත්‍ර කම්කරු | 6 |
| සෞඛ්‍ය කම්කරු | 2 |
| තාක්ෂණික සහකාර | 1 |
| අනුමැතියට යවා ඇති තනතුරු | |
| කළමනාකරණ සේවා නිලධාරි | 4 |
| ආදායම් පරීක්ෂක | 2 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක | 1 |
| දෙවන ශ්‍රේණියේ පුස්තකාලයාධිපති | 1 |
| තුන්වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපති | 4 |
| කාර්යාල කාර්ය සහායක | 2 |
| මෙම සියළුම තනතුරු සඳහා අයවැය ලේඛනයෙන් වැය ප්‍රතිපාදන සලසා ඇත. | |


සභාව
සභාපති
ලේකම්
උපදේශක කාරක සභා
මුදල් හා ප්‍රතිපත්ති
සංවර්ධන හා නිවාස
කාර්මික සේවා
ටෙන්ඩර්
පරිසර හා පහසුකම්
සංවර්ධන නිලධාරී
ප්‍රධාන කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
ආදායම් පරිපාලක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කම්කරු
පුස්තකාලාධිපති
පුස්තකාල සහායක
කාර්මික නිලධාරී
රියදුරු
මුරකරු
විදුලි කාර්මික
තාක්ෂණික සහකාර
වැඩ ක්ෂේත්‍ර කම්කරු
සෞඛ්‍ය කම්කරු
පෙර පාසල් පාලිකා
ආයුර්වේද වෛද්‍ය නිලධාරී
ඖෂධ සංයෝජක
බෙහෙත් ශාලා කම්කරු

# කාර්ය මණ්ඩල තොරතුරු

## ස්ථිර සේවකයින්

| අනු අංක | නම | තනතුර | මෙම සභාවට පත් වූ දිනය |
|---|---|---|---|
| වැඩ සටහන් අංක 01- පොදු පරිපාලනය | | | |
| 1 | එස්.රත්නාවති මැණිකේ මෙනවිය. | සංවර්ධන නිලධාරි (I ශ්‍රේණිය)ලේකම්(රා.ඉ) | 1999.05.27 |
| 2 | කේ.ක්‍රිෂාන්ති රේණුකා ප්‍රියදර්ශනී මිය. | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2013.05.02 |
| 3 | කේ.ආර්.ප්‍රියංකා සන්ජීවනි මෙනවිය. | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2013.09.24 |
| 4 | කේ.පී.ගීතා ප්‍රියදර්ශනී කුමාරසිංහ මිය. | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2014.04.29 |
| 5 | ආර්.ඩී.ජී.වික්‍රමසිංහ මිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2015.10.01 |
| 6 | ඩබ්.ජී.පී.එන්.ගුණරත්න මිය. | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2016.02.12 |
| 7 | එස්.එච්.එච්.එල්.ජයසූරිය මිය. | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2016.01.05 |
| 8 | ටී.කේ.පී.එල්. ධර්මරත්න මිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2017.02.01 |
| 9 | ජී. ජී. සී. ගුරුගේ මෙනවිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2017.02.03 |
| 10 | කේ.ජී.ඩී.චතුරිකා මිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2019.06.03 |
| 11 | එම්.ටී.ඩී.ධනපාල මිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2020.01.16 |
| 12 | ජේ.එන්.දිපිකා මිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2020.01.16 |
| 13 | ජී.එම්.කේ.එස්.මහාබෝධි මෙනෙවිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2020.02.12 |
| 14 | ඩබ.ඩබ්.එන්.එස්.ප්‍රේමරත්න මිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2020.02.03 |
| 15 | යූ.කේ.ශානිකා මිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2021.01.01 |
| 16 | එච්.කේ.ඩී.යූ.මධුශංක මයා | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2021.01.01 |
| 17 | එම්.යූ.එන්.කුමාර මයා | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2021.01.01 |
| 18 | එම්.එල්.ආර්.සංජීවනි මිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2021.05.10 |
| 19 | පී.ඩී.ඩී.සෝමසිරි මිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2021.05.11 |
| 20 | යූ.ආර්.එච්.ජී.බී.උළුගලතැන්න මිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2021.07.08 |
| 21 | එස්.එම්.යූ.සී.සමරසිරි මිය | සංවර්ධන නිලධාරි (III ශ්‍රේණිය) | 2021.07.01 |
| 22 | ජේ.එම්.එල්.චන්ද්‍රසිරි මයා | කළමනාකරණ සේවා නිලධාරි (III ශ්‍රේණිය) | 2016.01.20 |
| 23 | එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය. | කළමනාකරණ සේවා නිලධාරි (III ශ්‍රේණිය) | 2016.10.24 |
| 24 | ජී.අයි.යූ.ගුණසේකර මිය | කළමනාකරණ සේවා නිලධාරි (III ශ්‍රේණිය) | 2019.03.07 |
| 25 | ඩී.අයි.යූ.ජයසිංහ මෙනවිය | කළමනාකරණ සේවා නිලධාරි (III ශ්‍රේණිය) | 2019.03.07 |

| | | | |
|---|---|---|---|
| 26 | පි.කේ.ඩී.සී.කුමාරි මිය | කළමනාකරණ සේවා නිලධාරි (III ශ්‍රේණිය) | 2021.01.01 |
| 27 | කේ.යූ චමින්ද කුමාර වීරසේන මයා | කාර්යාල කාර්ය සහායක | 2009.11.01 |
| 28 | වයි.ඩබ්.චන්දන සුජිත් කුමාර මයා | කාර්යාල කාර්ය සහායක | 2014.04.01 |
| 29 | කේ.ඕ.සමන්ත පුෂ්ප කුමාර මයා | කාර්යාල කාර්ය සහායක | 2014.10.24 |
| 30 | එම්.ජී.එන් එම්.රත්නපාල මයා | රියදුරු | 2014.10.24 |
| 31 | ජී.වසන්ත ප්‍රේමලාල් මයා | රියදුරු | 2009.11.01 |
| 32 | එච්.ඩබ්.එස්.චින්තක මයා | රියදුරු | 2021.06.21 |

| වැඩ සටහන් අංක 02- සෞඛ්‍ය සේවා | | | |
|---|---|---|---|
| 33 | එල්.ජී.ශ්‍රියානි ලියනාරච්චි මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරි | 2014.05.05 |
| 34 | එල්.වී.ආර්.සුමනාවති මෙනවිය | ඖෂධ සංයෝජක | 2009.11.01 |
| 35 | ඩබ්.එච්.ආර්.කේ.එස්.පෙරේරා මයා | සෞඛ්‍ය කම්කරු | 1999.11.01 |
| 36 | ආර්.ජී.පතිරත්න මයා | සෞඛ්‍ය කම්කරු | 2009.11.01 |
| 37 | බී.අගතිරත්න මයා | සෞඛ්‍ය කම්කරු | 2014.04.01 |
| 38 | ඕ.ගයාන් අරවින්ද මයා | සෞඛ්‍ය කම්කරු | 2014.04.01 |
| 39 | එන්.ජී.නන්දාමාලනී මිය | සෞඛ්‍ය කම්කරු | 2014.04.01 |

| වැඩ සටහන් අංක 03 - භෞතික සැළසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | | | |
|---|---|---|---|
| 40 | ඩී.කේ.පී.ප්‍රේමලතා මිය | කාර්මික නිලධාරී | 2021.04.23 |
| 41 | කේ.ඩබ්.ජේ.සුරවීර මයා | කාර්මික නිලධාරී | 2020.02.12 |
| 42 | ටී.ලීලාරත්න මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2009.11.01 |
| 43 | ඩබ්ලිව්.ධනුෂ්ක විරසිංහ මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2014.08.01 |
| 44 | පි.එම්.එල්.විජය කුමාර මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2014.10.24 |
| 45 | ඩබ්.බී.චමින්ද කුමාර මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2014.10.24 |
| 46 | රෝයි මැල්කම් ද සිල්වා මයා | රියදුරු | 2014.04.01 |

| වැඩ සටහන් අංක 04 -ජල සේවා | | | |
|---|---|---|---|
| 47 | පි.කේ.මලිදු චාරුක සමරවීර මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2014.10.24 |
| 48 | කේ.ජී.එම්.අනුර ධර්මපාල හේරත් මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2014.08.01 |
| 49 | ඩබ්ලිව්.දයානන්ද මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2014.08.01 |
| 50 | ඩබ්ලිව් උපාලි තිලකරත්න මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2014.04.01 |

| වැඩ සටහන් අංක 05 - වෙනත් පොදු උපයෝගිතා සේවා | | | |
|---|---|---|---|
| 51 | ඒ.එම්.සිරිරත්න මයා | විදුලි කාර්මික | 2014.09.01 |

| වැඩ සටහන් අංක 06- සුබ සාධන සේවා | | | |
|---|---|---|---|
| 52 | පූජ්‍ය තැන්නයායේ සුමංගල හිමි | පුස්තකාල සහායක | 2014.10.24 |
| 53 | කේ.කේ.නන්දානිකා මිය | පුස්තකාලයාධිපති | 2012.07.04 |
| 54 | ඩී.කේ.ශාලික සුරංග චන්ද්‍රසේන මයා | පුස්තකාල සහායක | 2014.04.01 |
| 55 | ඊ.ඒ.යූ.ප්‍රභාත් මධුෂාන් එදිරිසිංහ මයා | පුස්තකාල සහායක | 2014.08.01 |
| 56 | පී.ජී.එස්.එම්.තිලකරත්න මිය | පුස්තකාල සහායක | 2014.10.24 |
| 57 | එන්.එච්.ලීලාවතී මැණිකේ මිය | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2014.10.24 |
| 58 | ඩබ්ලිව්.එම්.ආර්.කේ.ටී.එච්.මැණිකේ මිය | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2014.10.24 |

අනියම්/ආදේශක/තත්කාර්ය/කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදීම

| | | |
|---|---|---|
| 1 | බී.වී.රසික ප්‍රසාද් මයා | රියදුරු |
| 2 | එම්.ඒ.එන්.පී.මල්ලිකාආරච්චි මයා | රියදුරු |
| 3 | කේ.ඒ.පී.එල්.ආනන්ද මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු |
| 4 | ආර්.එම්.ඒ.ඩී.අබේවික්‍රම මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු |
| 5 | ඒ.බී.වී.පී.හේමරත්න මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු |
| 6 | එස්.ඩබ්ලිව්.තුෂාර ඉන්ද්‍රජිත මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු |
| 7 | ඩී.එස්.අමරසිංහ මයා | සෞඛ්‍ය කම්කරු |
| 8 | එන්.ගුණදාස මයා | සෞඛ්‍ය කම්කරු |
| 9 | එච්.ඩී.එස්.සී.කුමාර මයා | සෞඛ්‍ය කම්කරු |
| 10 | එල්.පී.එන්.ටී.ගුණවර්ධන මිය | පුස්තකාල සහායක |
| 11 | කේ.බී.පී පෙරේරා මෙනවිය | නැණසල ක්‍රියාකරු |
| 12 | ආර්.ඒ.එම්.එම්.රණසිංහ මයා | මුරකරු |
| 13 | පී.කේ.ප්‍රදීප් අත්තනායක මයා | සෞඛ්‍ය කම්කරු |
| 14 | එස්.එම්.ශසිකා සඳමාලි මිය | සෞඛ්‍ය කම්කරු |
| 15 | පී.ආර්.රණවීර මයා | කම්කරු |
| 16 | ඒ.බී.ඒ.එන්.ප්‍රේමරත්න මයා | කම්කරු |
| 17 | එන්.මදුෂාන් මයා | කම්කරු |

# 2022 අය වැය ලේඛනය - ආදායම් වියදම් තත්ත්වය

| | | | |
|---|---|---|---|
| පුනරාවර්තන ආදායම | | | |
| සභාවේ උත්පාදිත ආදායම | 34,697,938 | | |
| ආදායම් ආධාර හා වැටුප් ප්‍රතිපූර්ණ / මුද්දර ගාස්තු / උසාවි දඩ | 70,556,960 | **105,254,898** | |
| **ප්‍රාග්ධන ලැබීම්** | | | |
| ණය/ආධාර | | | |
| | | | |
| 2.81 සංවර්ධන ආධාර (සෞඛ්‍ය සේවා) | 20,000,000 | | |
| 3.81 කර්මාන්ත/සංවර්ධන ආධාර | 58,500,000 | | |
| 5.81 පොදු උපයෝගිතා සේවා | 53,000,000 | | |
| 6.81 සුභ සාධන සේවා | 21,900,000 | **153,400,000** | 258,654,898 |
| **පුනරාවර්තන වියදම්** | | | |
| සභාවේ පුනරාවර්තන වියදම | 95,818,656 | | |
| ප්‍රාග්ධන වියදම් | 159,400,000 | | |
| ණය ආපසු ගෙවීම් | 2,852,180 | **258,070,835** | 258,070,835 |
| 2022 වර්ෂය අවසානයේදී අපේක්ෂිත අතිරික්තය | | | **584,063** |

# 2022 වර්ෂය - ප්‍රාග්ධන වැය සාරාංශය

| විස්තරය | 1 | 2 | 3 | 4 | 5 | 6 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | ජල සේවා | වෙනත් පොදු උපයෝගිතා සේවා | සුභ සාධන සේවා | |
| පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම | 6,330,972 | (294,750) | (891,729) | 4,915,229 | 638,520 | (1,262,000) | 9,436,242 |
| එකතු කලා- ප්‍රාග්ධන ලැබිම | | | | | | | |
| 80 (01) ප්‍රාග්ධන ආධාර (සංවර්ධන) | 20,000,000 | 20,000,000 | 38,500,000 | | 53,000,000 | 21,900,000 | 153,400,000 |
| (02) ණය මුදල් | | | | | | | 0 |
| (03) වත්කම් විකුණුම් (මූලධන) | | | | | | | |
| එකතුව | 20,000,000 | 20,000,000 | 38,500,000 | - | 53,000,000 | 21,900,000 | 153,400,000 |
| අඩු කලා-ප්‍රාග්ධන වැය | | | | | | | |
| 09. (01) උපකරණ වැය | 900,000 | 200,000 | | 300,000 | | 1,400,000 | 2,800,000 |
| (08.)ඉඩම් / ගොඩනැගිලි | | 20,000,000 | 114,700,000 | | | 21900000 | 156,600,000 |
| | | | | | | | |
| | | | | | | | |
| 410 ණය ආපසු ගෙවීම | | | 1,598,229 | 1,253,951 | | | 2,852,180 |
| එකතුව | 900,000 | 20,200,000 | 116,298,229 | 1,553,951 | - | 23,300,000 | 162,252,180 |
| අතිරික්තය/ඌනතාවය | 25,430,972 | (494,750) | (78,689,957) | 3,361,278 | 53,638,520 | (2,662,000) | 584,063 |

# 2022 වර්ෂය සදහා ආදායම් සාරාංශය

| ශීර්ෂ සංකේතය | අදාල විෂය විස්තරය | 1 | 2 | 3 | 4 | 5 | 6 | එකතුව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩලය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම්හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් පොදු උපයෝගිතා සේවා | සුභ සාධන සෙවා | | |
| 10 | වරිපනම් හා බදු | 1,164,172 | 413,000 | | 7,805,000 | | 1000 | **9,383,172** | 8.91 |
| 20 | කුලී | 50,000 | 1,000,000 | 2,149,696 | 250,000 | 1,390,520 | 5,000 | **4,845,216** | 4.60 |
| 30 | බලපත්‍ර ගාස්තු | 700,500 | 897,750 | 0 | 0 | 0 | 0 | **1,598,250** | 1.52 |
| 40 | සේවා සදහා ගාස්තු | 200,300 | 50,000 | 785,000 | 708,000 | 10,000 | 127,000 | **1,880,300** | 1.79 |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ | 6,008,000 | 10,000 | 30,500 | 50,000 | 10,000 | 45,000 | **6,153,500** | 5.85 |
| 60 | වෙනත් ආදායම් | 7,190,500 | 2,115,000 | 8,000 | 8,000 | 8,000 | 228,000 | **9,557,500** | 9.08 |
| 70 | ආදායම් ආධාර | 31,701,660 | 10,412,160 | 11,645,180 | 5,824,600 | 4,810,080 | 7,443,280 | **71,836,960** | 68.25 |
| | මුළු ආදායම | **47,015,132** | **14,897,910** | **14,618,376** | **14,645,600** | **6,228,600** | **7,849,280** | **105,254,898** | **100** |
| | අඩු කළා - පුනරාවර්තන වියදම | **40,684,160** | **15,192,660** | **15,510,104** | **9,730,371** | **5,590,080** | **9,111,280** | **95,818,656** | |
| | පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම | **6,330,972** | **(294,750)** | **(891,729)** | **4,915,229** | **638,520** | **(1,262,000)** | **9,436,242** | |

# වැලිගෙපොල ප්‍රාදේශීය සභාව - ආදායම් විශ්ලේෂණය

## 2020 ඇස්තමේන්තුව




| | % |
|---|---|
| වරිපනම් හා බදු | 9.87 |
| කුලී | 2.35 |
| බලපත්‍ර ගාස්තු | 2.75 |
| සේවා සදහා ගාස්තු | 3.03 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 7.01 |
| වෙනත් ආදායම් | 9.02 |
| ආදායම් ආධාර | 65.98 |

## 2021 ඇස්තමේන්තුව




| | % |
|---|---|
| වරිපනම් හා බදු | 9.38 |
| කුලී | 2.20 |
| බලපත්‍ර ගාස්තු | 1.90 |
| සේවා සදහා ගාස්තු | 2.26 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 6.19 |
| වෙනත් ආදායම් | 8.01 |
| ආදායම් ආධාර | 70.05 |

## 2022 ඇස්තමේන්තුව




| | % |
|---|---|
| වරිපනම් හා බදු | 8.91 |
| කුලී | 4.60 |
| බලපත්‍ර ගාස්තු | 1.52 |
| සේවා සදහා ගාස්තු | 1.79 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 5.85 |
| වෙනත් ආදායම් | 9.08 |
| ආදායම් ආධාර | 68.25 |

# 2022 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සාරාංශය

| ශීර්ෂ අංකය | වැය විෂය විස්තරය | 1<br>පොදු පරිපාලන හා කාර්ය මණ්ඩලය | 2<br>සෞඛ්‍ය සේවා | 3<br>භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | 4<br>ජල සේවා | 5<br>වෙනත් පොදු උපයෝගිතා සේවා | 6<br>සුභ සාධන සේවා | එකතුව | ප්‍රතිශතය% |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා වේතන | 30,470,660 | 9,377,160 | 10,331,180 | 5,004,600 | 1,845,080 | 6,793,280 | 63,821,960 | 66.61 |
| 2 | ගමන් වියදම් | 390,000 | 64,000 | 195,400 | 15,000 | 10,000 | 51,000 | 725,400 | 0.76 |
| 3 | සැපයුම් හා උපකරණ | 3,594,000 | 1,750,000 | 1,065,000 | 270,000 | 700,000 | 581,000 | 7,960,000 | 8.31 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | 3,268,000 | 2,535,000 | 2,540,000 | 605,000 | 3,001,000 | 1,220,000 | 13,169,000 | 13.74 |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා, ආවශ්‍යක හා වෙනත් සේවා | 2,847,000 | 1,335,000 | 26,000 | 2,510,000 | 34,000 | 276,000 | 7,028,000 | 7.33 |
| 6 | පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 500 | 500 | 1186524.3 | 1,275,771 | | | 2,463,296 | 2.57 |
| 7 | ආධාර මුදල්,දායක මුදල් හා සහනාධාර | 5,000 | 1,000 | 1,000 | 5,000 | | 150,000 | 162,000 | 0.17 |
| 8 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 109,000 | 130,000 | 165,000 | 45,000 | | 40,000 | 489,000 | 0.51 |
| | **පුනරාවර්තන වැය එකතුව** | **40,684,160** | **15,192,660** | **15,510,104** | **9,730,371** | **5,590,080** | **9,111,280** | **95,818,656** | **100** |

# වැලිගෙපොල ප්‍රාදේශීය සභාව - වියදම් විශ්ලේෂණය

## 2020 ඇස්තමේන්තුව




## 2021ඇස්තමේන්තුව




## 2022ඇස්තමේන්තුව




| | % |
|---|---|
| වැටුප් හා වේතන | 64.93 |
| ගමන් වියදම් | 0.94 |
| සැපයුම් හා උපකරණ | 10.07 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා/නඩත්තු | 11.46 |
| ප්‍රවාහන සම්බන්ධතා, ආවශ්‍යතා සේවා හා වෙ | 8.40 |
| පොලී ගෙවීම්, ලාභාංශය හා ප්‍රසාද මුදල් | 3.43 |
| ආධාර මුදල්,දායක මුදල් හා සහනාධාර | 0.21 |
| විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂක | 0.57 |

| | % |
|---|---|
| වැටුප් හා වේතන | 67.22 |
| ගමන් වියදම් | 0.87 |
| සැපයුම් හා උපකරණ | 7.50 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා/නඩත්තු | 13.49 |
| ප්‍රවාහන සම්බන්ධතා, ආවශ්‍යතා සේවා හා වෙ | 6.99 |
| පොලී ගෙවීම්, ලාභාංශය හා ප්‍රසාද මුදල් | 3.18 |
| ආධාර මුදල්,දායක මුදල් හා සහනාධාර | 0.19 |
| විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂක | 0.56 |

| | % |
|---|---|
| වැටුප් හා වේතන | 66.61 |
| ගමන් වියදම් | 0.76 |
| සැපයුම් හා උපකරණ | 8.31 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා/නඩත්තු | 13.74 |
| හා වෙනත් සේවා | 7.33 |
| පොලී ගෙවීම්, ලාභාංශය හා ප්‍රසාද මුදල් | 2.57 |
| ආධාර මුදල්,දායක මුදල් හා සහනාධාර | 0.17 |
| විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂක | 0.51 |

# ජනසෙත සුරකිමු

## ආදායම් වියදම් ඇස්තමේන්තුව



# 1 පොදු පරිපාලනය

වැඩසටහන් අංක 01 යටතේ ඇස්තමේන්තු කර ඇති පුනරාවර්තන ආදායම් ප්‍රභවයන් මෙසේය

10. වරිපනම් හා බදු

**වරිපනම් හා බදු1.11**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාර මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල පිහිටි දේපලවලට වරිපනම් බදු පැනවීමට ගෙන ඇති තිරණය ප්‍රකාර එකි සීමාවන් ඇතුළත 2014 වර්ෂයේදී එක් එක් දේපල මත වාර්ෂික ඇස්තමේන්තුවෙන් 6%ක වරිපනම් බද්දක් පැනවීමට තිරණය කර ඇත. දැනට හඳුනාගෙන ඇති දේපල සංඛ්‍යාව 1267 ක් වන අතර, 2022 වර්ෂය සඳහා වරිපනම් බදු වටිනාකම රු1,143,267/- ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත.

**අක්කර බදු 1.12**

ප්‍රාදේශීය සභා පනතේ 134(3) වගන්තිය ප්‍රකාර සභා බල ප්‍රදේශය තුල පිහිටියා වූ ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ එක් එක් ඉඩම් හෙක්ටාරය මත පහත දක්වා ඇති අනුප්‍රමාණයන් නොඉක්මවන අක්කර බද්දක් අයකිරීම සඳහා ප්‍රතිපාදන සැලසී ඇත.

ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක රු. 50 ක්ද,

ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 5 ක් හෝ ඊට වැඩිවන අවස්ථාවක රු. 10 ක්ද වශයෙන් අක්කර බද්දක් අය කිරීමට 2022 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මෙම ආදායම් විෂය යටතේ හඳුනාගෙන ඇති ඉඩම් සංඛ්‍යාව 154 ක් වන අතර එම නිසා රු. 20,905/- ක අක්කර බදු ආදායමක් 2022 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු ගත කර ඇත.

30 - බලපත්‍ර ගාස්තු

වාහන බලපත්‍ර ගාස්තු(පා පැදි බලපත්‍ර)1.35

ප්‍රාදේශීය සභා පනතේ 147(1) (අ) වගන්තිය ප්‍රකාර වාහන හා සතුන් පිළිබඳ බද්දක් අය කල හැකි බවට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව මෙම පනතේ හතරවන උපලේඛනය අනුව මෙසේ අයකල යුතු වාර්ෂික බදු ප්‍රමාණයන් නියම කර ඇත. ඒ අනුව පාපැදියක් සඳහා අය කල යුතු මුදල රු. 4.00 ක් ලෙස සඳහන්ව ඇත. පසුගිය වසර කිහිපයක මේ විෂය යටතේ එකතු වූ ආදායම සැලකිල්ලට ගෙන 2022 වර්ෂය වෙනුවෙන් මේ විෂය යටතේ රු.400/- ක ආදායමක් ඇස්තමේන්තු කර ඇත.

**40 - සේවා සඳහා ගාස්තු**

සභාව විසින් සපයනු ලබන විවිධ සේවාවන් වෙනුවෙන් ගාස්තුවක් අයකරනු ලබයි. මෙම සභාව විසින් පහත සඳහන් සේවාවන් සැපයීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු ප්‍රමාණයන් මෙසේය. මේ ගාස්තු ප්‍රමාණයන් 2022 වර්ෂයටද අයකරනු ලබයි.

**විවිධ වර්ගයේ අය කිරීම් 2022 වර්ෂය**

| | | | | |
|---|---|---|---|---|
| 1. | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා | | රු. | 1000.00 |
| 2. | කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා | | රු. | 1000.00 |
| 3. | පුස්තකාල සාමාජිකත්වය සඳහා | වැඩිහිටි | රු. | 100.00 |
| | | ළමා | | 50.00 |
| 4. | පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම සඳහා | වැඩිහිටි | රු. | 50.00 |
| | | ළමා | | 30.00 |
| 5. | පුස්තකාල පොත් බැහැරගෙන යාම ප්‍රමාද ගාස්තු (දිනකට) | | රු. | 1.00 |
| 6. | නොපවරා ගැනීම/විරීරෝබාසහතිකයක් නිකුත් කිරීම | | රු. | 500.00 |
| 7. | හිමිකම් සහතිකයක් හෝ වෙනත් යම් සහතිකයක් සඳහා | | රු. | 100.00 |
| 8 | ජල බවුසරය කුළියට දීම දිනකට (සභා කාර්යාලයේ සිට කි.මී.01 ක් ඇතුළත රු.3000/-ක් ලෙසත්,ඉන් බැහැරව වැඩිවන සෑම කි.මී 01 ක් සඳහා රු.50.00 ක් ලෙසත් ගෙවිය යුතුය) | | රු | 3000.00 |
| | ජල බවුසරය රඳවා ගන්නේ නම් එක් දිනකට අය කිරීම | | රු | 500.00 |

| | | | |
|---|---|---|---|
| 9 | බිම් කට්ටි සැලසුම් අනුමත කිරීමේ අයදුම්පතක් සඳහා | රු. | 100.00 |
| 10 | බිම් කට්ටි සැලසුම් අනුමත කිරීම | රු | 500.00 |
| 11 | ට්‍රැක්ටර් කුළියට දීම (යන්ත්‍ර පැය 1ක් සඳහා )<br>යම් හෙයකින් මීටරය අක්‍රිය වුවහොත් දිනකට ට්‍රැක්ටර් කුළිය | රු.<br>රු. | 1100.00<br>5000.00 |
| 12 | එක් ත්‍රී රෝද රථයක්වෙනුවෙන් මසකට රු.100.00 බැගින් වර්ෂයට | රු. | 1200.00 |
| 13 | ගොඩනැඟිලි අයදුම්පතක් සඳහා | රු. | 300.00 |
| 14 | ඔප්පු උධෘත පෝරම් 01 ක් සඳහා | රු. | 100.00 |
| 15 | ක්‍රීඩා පිටි/පොල කුළියට දීම -(දිනකට) | රු. | 500.00 |
| 16 | අනතුරුදායක කොස් ගසක්/ අතු කපා ඉවත් කිරීමේ අයදුම්පත් පරීක්ෂණ ගාස්තු | රු. | 1000.00 |
| 17 | අනතුරුදායක වෙනත් ගසක් / අතු කපා ඉවත් කර ගැනීමේ පරීක්ෂණ ගාස්තු | රු. | 500.00 |
| 18 | මාළු අලෙවිය(ජංගම)දිනකට | | |
| | බයිසිකලයකින් දිනකට | රු. | 25.00 |
| | මෝටර් වාහනයකින් දිනකට | රු. | 50.00 |
| | ලැල්ලකින්/පෙට්ටියකින් දිනකට | රු. | 50.00 |
| 19 | ලොතරැයි අලෙවිකරණ වාහනයකින් දිනකට | රු. | 50.00 |
| 20 | සුනඛයින් ලියාපදිංචි කිරීම (එක් සුනඛයෙකු සඳහා) | රු. | 25.00 |
| 21 | හෙල බොජුන් හල සේවා සැපයීම<br>I.අලෙවි ප්‍රදර්ශන කුටි සඳහා(දිනකට) | රු. | 100.00 |
| 22 | ප්‍රදේශයේ තැනින් තැනට ගොස් ලී ඉරීමේ යන්ත්‍රයක් භාවිතා කිරීම | රු | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 23 | භූමි යෝග්‍යතා සහතික ඉල්ලුම් පත්‍රයක් | | රු | 25.00 |
| 24 | ප්‍රචාරණ කටයුතු සඳහා දිනකට | | රු | 1000.00 |
| 25 | ගව ඝාතනය එක් අවසර පත්‍රයක් සඳහා | | රු | 500.00 |
| 26 | ජේ.සී.බී.යන්ත්‍රය කුළියට දීම(යන්ත්‍ර පැය එකක් සඳහා)<br>යම් හෙයකින් මීටරය අක්‍රිය වුවහොත් දිනකට | | රු<br>රු | 2200.00<br>8000.00 |
| 27 | ප්‍ර දේශයේ තැනින් තැනට ගොස් වඩු කාර්මික යන්ත්‍රයක් භාවිතා කිරීම | | රු | 1000.00 |
| 28 | දුරකථන කුළුණු සඳහා ගාස්තු අය කිරීම<br>● උස මීටර් 05-මීටර් 20 දක්වා<br>●මීටර් 20ට වැඩි වන සෑම මීටරයක් සඳහාම | | <br>රු<br>රු | <br>20000.00<br>100.00 |
| 29 | නැණසල ගාස්තු අයකිරීම | පරිගණක පංති ගාස්තු(පැයකට | රු | 50.00 |
| | | ඇතුලත් වීමේ ගාස්තු | රු | 250.00 |
| | | විභාග ගාස්තු | රු | 300.00 |
| | | අන්තර්ජාල භාවිතය( පැයකට) | රු | 50.00 |
| | | ඊ- මේල් යැවීම (25 මෙ.බ | රු | 30.00 |
| | | ඡායා පිටපත් කිරීමේ ගාස්තු | | |
| | | A4 තනි පැත්ත | රු | 4.00 |
| | | A4 දෙ පැත්ත | රු | 5.00 |
| | | A3තනි පැත්ත | රු | 8.00 |
| | | A3 දෙ පැත්ත | රු | 10.00 |
| | | legle තනි පැත්ත | රු | 6.00 |
| | | legle දෙ පැත්ත | රු | 8.00 |
| | | A5තනි පැත්ත | රු | 2.00 |
| | | A5 දෙ පැත්ත | රු | 3.00 |
| | | B5තනි පැත්ත | රු | 3.00 |
| | | B5 දෙපැත්ත | රු | 4.00 |
| | | ටයිප් සෙටින්(A4) | රු | 50.00 |
| | | ප්‍රින්ට් අවුට(A4) | රු | 10.00 |
| | | ස්කෑන්(A4 | රු | 20.00 |

| | | | | |
|---|---|---|---|---|
| 30 | ජල සැපයුම් අංශය හා සම්බන්ධ විවිධ අය කිරීම | 1.ජල අයදුම්පතක් නිකුත් කිරීම<br>2.ජල සැපයුමක් සඳහා මූලික ගෙවීම<br>3.ජල පාරිභෝගික බිල්පතේහි සඳහන් නාමය වෙනස් කිරීම<br>4.විසංධි කල ජල සැපයුමක් නැවත සංධි කිරීමේ සේවා ගාස්තුව<br>5.අනවසරයෙන් ජලය ගැනීම වෙනුවෙන් අය කරන දඩ මුදල | රු.<br>රු.<br>රු.<br>රු.<br>රු. | 50.00<br>10,500.00<br>1,000.00<br>500.00<br>5,000.00<br>5,000.00 |
| 31 | පුස්තකාල පොත් උඩෘත ඡායා පිටපත් කිරීම-අන්තර්ජාල පිටපත් | 1.A4තනි පැත්ත<br>2. A4 දෙපැත්ත<br>3. A3 තනි පැත්ත<br>4.A3 දෙපැත්ත<br>5. Leagalතනි පැත්ත<br>6. Leagal දෙපැත්ත<br>7.print out A4<br>8.Colour Prent out A4 | රු<br>රු<br>රු<br>රු<br>රු<br>රු<br>රු<br>රු | 3.00<br>4.00<br>4.00<br>5.00<br>5.00<br>7.00<br>10.00<br>50.00 |
| 32 | ප්‍රතිභා සහරාව පිටපතක් | | රු | 125.00 |
| 33 | පොත් බැඳීම<br>• පොඩි පොතක්<br>• ලොකු පොතක් | | රු<br>රු | 50.00<br>100.00 |
| 34 | ස්කෑන්(A4) | | රු | 20.00 |
| 35 | පුස්තකාල-අන්තර්ජාල භාවිතය (පැයකට | | රු | 40.00 |
| 36 | තාක්ෂණික නව නිපයුම් ව්‍යාපෘතිය(පන්ති ගාස්තුව ඇතුළුව එක් අයෙක් සඳහා) | | රු | 200.00-<br>1000.දක්වා |

| | | | |
|---|---|---|---|
| 37 | ගලි බවුසරයේ සේවය සැපයීම<br>I, ලෝඩ 01 ක් ඉවත් කිරීම සඳහා<br>II.ලෝඩ 01 ක් අවසාන බැහැලීම සඳහා<br>III.ප්‍රවාහන ගාස්තුව<br>● කි.මී10 ක් ඇතුළත<br>● වැඩිවන සෑම කි.මී.01 ක් සඳහා | රු<br>රු<br>රු<br>රු | 4500.00<br>1250.00<br>2500.00<br>100.00 |
| 38 | රැස්වීම් ශාලාව කුලියට දීම(දිනකට)<br>I.උත්සව අවස්ථා සඳහා<br>II.අලෙවි ප්‍රදර්ශන කටයුතු සඳහා<br>III. රැස්වීම් කටයුතු සඳහා<br>IV.පෙර පාසල්/පාසල් උත්සව සඳහා | රු<br>රු<br>රු<br>රු | 5000.00<br>5000.00<br>5000.00<br>1000.00 |

## 1.50 වරෙන්තු ගාස්තු හා දඩ

## 1.52 උසාවි දඩ

ප්‍රාදේශීය සභා පනත මෙන්ම වෙනත් අණපනත් ක්‍රියාත්මක කිරීමේදී මෙන්ම නීතිය ක්‍රියාත්මක වීම තුලින් උසාවිය විසින් අය කර ගන්නා වූ දඩ මුදල් වලින් ප්‍රාදේශීය සභාව වෙත ලැබේවියැයි අපේක්ෂිත ආදායම මේ යටතේ ඇස්තමේන්තු කර ඇත. පසුගිය වර්ෂ කිහිපයක ලැබී ඇති උසාවි දඩ ආදායම උපකල්පනය කරමින්, 2022 වර්ෂය වෙනුවෙන් උසාවි දඩ ආදායම රු. 6,000,000.00ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත.

## 1.60 වෙනත් ආදායම්

## 1.65 මුද්දර ගාස්තු

ඊට අමතරව,ප්‍රදේශයේ සංවර්ධනයත් සමඟ සිදුවන ඉඩම් ගනුදෙනු කිරීම තුලින් මුද්දර ගාස්තු ආදායමක් ලෙස 2022 වර්ෂය සඳහා රුපියල් 7,000,000/- ක් ඇස්තමේන්තු කර ඇත.මෙම ආදායම ඇස්තමේන්තු කර ඇත්තේ පසුගිය වර්ෂ කිහිපය තුලදී මුද්දර ගාස්තු වශයෙන් ලැබී ඇති ආදායම පදනම් කරගෙනය.

## 1.62 විකුණුම්

වැඩ සටහන් 01 යටතේ වන ආකෘති පත්‍රහා පෝරම ආදිය විකිණීමෙන් ලැබෙන ආදායම ද 1.64 යටතේ සභා සේවකයින් වෙනුවෙන් ලබා දී ඇති සේවක ණය පොලිය ආදායමක් ලෙස ද මේ යටතේ ඇස්තමේන්තු කර ඇත.

දැනට මෙම සභාව විසින් මෙම වැඩ සටහන යටතේ විකුණනු ලබන ආකෘති හා පෝරම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු ප්‍රමාණයන් මෙසේය.

| | | |
|---|---|---|
| ඔප්පු උධෘත පෝරම කට්ටල | 1 ක් | රු. 100.00 |
| ගොඩනැගිලි අයදුම්පත්‍ර | 1 ක් | රු. 300.00 |
| බිම් කට්ටි සැලසුම් අනුමත කිරීමේ අයදුම්පත් | 1 ක් | රු. 100.00 |

ආදායම් ආධාර - 70

මෙම ප්‍රාදේශීය සභාව වෙනුවෙන් වැඩ සටහන් අංක 01 යටතේ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය 31 කි.

2022 වර්ෂය වෙනුවෙන් සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය වශයෙන් රු.25,721,660.00ක්ඇස්තමේන්තු කර ඇත.

සභාපතිතුමා ඇතුළු ප්‍රාදේශීය සභා සභිකවරුන්ගේ දීමනා යටතේ ප්‍රතිපූර්ණය ලෙස අපේක්ෂිත මුදල රුපියල් 3,780,000කි. කාර්ය මණ්ඩල සේවකයින්ගේ දේපල ණය වෙනුවෙන් පළාත් සභාව විසින් ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල රුපියල් 200,000.00 ක් ලෙසද,ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ වැඩ සටහන් අංක 01 සඳහා රුපියල් 2,000,000.00 ක් ද ඇස්තමේන්තු කර ඇත.

# 2022 ආදායම් ඇස්තමේන්තුව

වැඩ සටහන් අංක 01පොදු පරිපාලනය

| ආදායම් සංකේත හා අය විෂය නාම | | | 2020 සත්‍ය ආදායම | 2021 ආදායම ඇස්තමේන්තු | 2022 ආදායම ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|
| පොදු පරිපාලනය | | | | | |
| | වරිපනම් හා බදු | | | | |
| 10 | 11 | වරිපනම් බදු | 2,356,387 | 1,143,267 | 1,143,267 |
| | 12 | අක්කර බදු | 12,842 | 20,905 | 20,905 |
| | | | **2,369,229** | **1,164,172** | **1,164,172** |
| 20 | කුලී | | | | |
| | 25 | රැස්වීම් ශාලාව කුලියට දීම | - | 50,000 | 50,000 |
| | | | **-** | **50,000.00** | **50,000** |
| | | බලපත්‍ර ගාස්තු | | | |
| 30 | 33 | වෘත්තිය බලපත්‍ර ගාස්තු | | 100 | 100 |
| | 35 | වාහන හා සත්ව බදු | 44 | 400 | 400 |
| | 37 | වෙනත්(දැන්වීම් පුවරු ගාස්තු/අහස් දැන්වීම්) | 359,200 | 800,000 | 700,000 |
| | | | **359,244** | **800,500** | **700,500** |
| 40 | සේවා සඳහා ගාස්තු | | | | |
| | 41 | ලියා පදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | | 300 | 300 |
| | 43 | අයකර ගත හැකි ගාස්තු(සැපයුම් කරුවන් ලියා පදිංචි කිරීම) | 107,103 | 200,000 | 200,000 |
| | | | **107,103** | **200,300** | **200,300** |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ | | | | |
| | 51 | වරෙන්තු ගාස්තු හා දඩ | 2403 | 2,000 | 8,000 |
| | 52 | උසාවි දඩ | 5,447,749 | 5,500,000 | 6,000,000 |
| | | එකතුව | **5,450,152** | **5,502,000** | **6,008,000** |

# 2022 ආදායම් ඇස්තමේන්තුව

වැඩ සටහන් අංක 01පොදු පරිපාලනය

| ආදායම් සංකේත හා අය විෂය නාම | | | 2020 සත්‍ය ආදායම් | 2021 ආදායම් ඇස්තමේන්තුව | 2022 ආදායම් ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| පොදු පරිපාලනය | | | | | |
| 60 | වෙනත් ආදායම් | | | | |
| | 61 | පොලී(ආයෝජන) | | 500 | 500 |
| | 62 | විකුණුම් (මුද්‍රිත පෝරම/අබලි ද්‍රව්‍ය/ඔප්පු ලුහුඩු සාරාංශ/ගොඩනැගිලි අයදුම්පත් බිම් කට්ටි සැලසුම් අයදුම් පත්) | 45,100 | 50,000 | 100,000 |
| | 64 | ක්‍රියාත්මක ආදායම්(සේවක ණය පොලී/ව්‍යාපෘති ආදායම්) | 78,470 | 80,000 | 90,000 |
| | 65 | මුද්දර ගාස්තු | 10,054,865 | 6,500,000 | 7,000,000 |
| | | | **10,178,435** | **6,630,500** | **7,190,500** |
| | | | | | |
| 70 | ආදායම් ආධාර | | | | |
| | 71 | සේවක වැටුප් ප්‍රතිපූර්ණ | 14,399,901 | 20,567,600 | 25,721,660 |
| | 71A | මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණ | 3,780,000 | 3,780,000 | 3,780,000 |
| | 72 | සාමූහික ආධාර (පළාත් සභා ප්‍රතිපූර්ණ - දේපල සඳහා ණය) | 134,604 | 90,000 | 200,000 |
| | 73 | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන | | 2,000,000 | 2,000,000 |
| | | | **18,314,505** | **26,437,600** | **31,701,660** |
| | | | **36,778,668** | **40,785,072** | **47,015,132** |
| | මුළු එකතුව | | | | |

# 2022 වියදම් ඇස්තමේන්තුව

වැඩ සටහන් අංක 01පොදු පරිපාලනය

| වැය විෂය සංකේත | වැය විෂය විස්තරය | | 2020 සත්‍ය වියදම් | 2021 වියදම් ඇස්තමේන්තු | 2022 වියදම් ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|
| 101 | | වැටුප් හා වේතන | | | |
| | 101(1) | වැටුප් හා දීමනා | 14,870,032 | 20,567,600 | 25,721,660 |
| | 101(2) | අතිකාල හා නිවාඩු දින වැටුප් | 302,091 | 380,000 | 375,000 |
| | 101(3) | නිල ඇඳුම් දීමනා | 24,000 | 34,000 | 34,000 |
| | 101(4) | මන්ත්‍රී දීමනා | 3,780,000 | 3,780,000 | 3,780,000 |
| | 101(9)1 | වෙනත්(නිලධාරීන් පුහුණු කිරීම) | | 150,000 | 50,000 |
| | 101(9)2 | වෙනත් දීමනා | 250,500 | 392,000 | 392,000 |
| | 101(9)3 | වෙනත් දීමනා | 74,866 | 50,000 | 73,000 |
| | 101(9)4 | භාෂා පරිවර්ථන දීමනා | 22,868 | 50,000 | 45,000 |
| | | | **19,324,357** | **25,403,600** | **30,470,660** |
| 102 | ගමන් වියදම් | | | | |
| | 102(1)1 | ගමන් වියදම් (කාර්ය මණ්ඩල නොවන) | | 40,000 | 35,000 |
| | 102(1)11 | ගමන් වියදම් (කාර්ය මණ්ඩල ) | 108,985 | 400,000 | 350,000 |
| | 102(2) | ගමන් වියදම් (ස්ථාන මාරු) | - | 5,000 | 5,000 |
| | | | **108,985** | **445,000** | **390,000** |
| 103 | සැපයුම් හා උපකරණ | | | | |
| | 103(1) | ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 493,331 | 510,000 | 500,000 |
| | 103(2)A | ඉන්ධන හා ලිහිසි තෙල්(කාර්ය මණ්ඩල) | 429,215 | 550,000 | 600,000 |
| | 103(2)B | ඉන්ධන හා ලිහිසි තෙල්(කාර්ය මණ්ඩල නොවන මන්ත්‍රී ඉන්ධන සමග) | 1,743,413 | 1,900,000 | 2,140,000 |
| | 103(6) | සංග්‍රහ වියදම් | 154,478 | 175,000 | 174,000 |
| | 103(8) | වෙනත් ගබඩා භාණ්ඩ | 45,605 | 180,000 | 180,000 |
